www.AlevelApi.com



# 2012 MARKING SCHEME

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

| | |
|---|---|
| ★ | II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2. හා 4.3 ඇසුරෙන් සකස් කර ඇත. |

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත **ලකුණු ප්‍රමාණය** 10 කි.)

1. (*a*) පහත දක්වෙන ප්‍රශ්නවලට, දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.

(i) ජලීය ද්‍රාවණයේ පවතින $Fe^{3+}$, $Cr^{3+}$ සහ $Co^{2+}$ යන අයන තුන අතුරෙන් ව්‍යුග්ම ඉලෙක්ට්‍රෝන **තුනක්** ඇත්තේ කුමකට ද? ..... $Cr^{3+}$ හෝ $Co^{2+}$ (හෝ යන දෙක ම)

(ii) 3*d* ගොනුවේ Ti, V සහ Cr යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, බන්ධන සෑදීමේදී උපරිම වශයෙන් ඉලෙක්ට්‍රෝන **පහක්** සහභාගි විය හැකි මූලද්‍රව්‍යය කුමක් ද? ..... V

(iii) C, N හා Si යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, **අඩුම විද්‍යුත්සෘණතාව** ඇත්තේ කුමකට ද? ..... Si

(iv) Na, Mg හා Al යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, **වැඩිම** පළමුවන අයනීකරණ ශක්තිය ඇත්තේ කුමකට ද? ..... Mg

(v) $N^{3-}$, $O^{2-}$ හා $F^-$ යන සමඉලෙක්ට්‍රොනික ඇනායන තුන අතුරෙන්, **විශාලතම** අයනික අරය ඇත්තේ කුමකට ද? ..... $N^{3-}$

(vi) $Na^+$, $Ca^{2+}$ හා $Al^{3+}$ යන කැටායන තුන අතුරෙන්, **කුඩාම** අයනික අරය ඇත්තේ කුමකට ද? ..... $Al^{3+}$

(05 × 6 = ලකුණු 30)

(*b*) ආම්ලිකෘත ජලීය නයිට්‍රයිට ද්‍රාවණ $H_2O_2$ භාවිතයෙන් නයිට්‍රේට බවට ඔක්සිකරණය කිරීමේදී අතරමැදි ඵලයක් ලෙස පෙරොක්සොනයිට්‍රස් අම්ලය (HOONO) සෑදේ. පෙරොක්සොනයිට්‍රයිට අයනය $[OONO]^-$ සම්බන්ධයෙන් (i) සිට (vii) තෙක් කොටස් සඳහා පිළිතුරු සපයන්න. එහි සැකිල්ල පහත දී ඇත.

O—O—N—O

(i) මෙම අයනය සඳහා **වඩාත් ම** පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.



(ලකුණු 06)



සඳහා ලකුණු නැත

(ii) මෙම අයනය සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. හේතු දක්වමින් ඒවායේ සාපේක්ෂ ස්ථායිතා පිළිබඳව අදහස් දක්වන්න.

(02) (02)



| | | |
|---|---|---|
| ස්ථායී (01) | අස්ථායී (01) | අස්ථායී (01) |
| හේතුව : වඩාත් විද්‍යුත් සෘණ ඔක්සිජන් පරමාණුව මත සෘණ ආරෝපණය පැවතීම (01) | ආරෝපණ වෙන්වීම වැඩිය. හෝ විද්‍යුත් සෘණ ඔක්සිජන් පරමාණුව මත ධන ආරෝපණයක් පැවතීම (02) | ආරෝපණ වෙන්වීම වැඩිය. හෝ විද්‍යුත් සෘණ ඔක්සිජන් පරමාණුව මත ධන ආරෝපණයක් පැවතීම (02) |

(ලකුණු 12)

(iii) VSEPR වාදය භාවිතකරමින් පහත පරමාණු වටා ඇති හැඩ ව්‍යුත්පන්න කරන්න.

I. N ..... සංයුජතා ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 4 ..... (ලකුණු 01)

VSEPR යුගල සංඛ්‍යාව හෝ ..... (ලකුණු 01)

සිග්මා බන්ධන ගණන + එකසර ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 3 ..... (ලකුණු 01)

එකසර ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 1 ..... (ලකුණු 01)

හැඩය = කෝණික හෝ V හැඩය ..... (ලකුණු 01)

Visit EDUHUB ... කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

02

II. N සහ O යන දෙකටම බැඳුණු O

සංයුජතා ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 4 (ලකුණු 01)

VSEPR යුගල සංඛ්‍යාව හෝ

සිග්මා බන්ධන ගණන + එකසර ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 4 (ලකුණු 01)

හැඩය = කෝණික හෝ V හැඩය (ලකුණු 01)

එකසර ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව = 2 (ලකුණු 01)

(iv) පහත දී ඇති වගුවෙහි,

I. පරමාණු වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය (ඉලෙක්ට්‍රෝන යුගල්වල සැකසුම)

II. පරමාණුවල මුහුම්කරණය

සඳහන් කරන්න.

| | | N | N සහ O යන දෙකටම බැඳුණු O |
|---|---|---|---|
| I. | ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | තලීය ත්‍රිකෝණාකාර | චතුස්තලීය |
| II. | මුහුම්කරණය | $sp^2$ | $sp^3$ |

$(02 \times 04 =$ ලකුණු 08)

(v) ආසන්න බන්ධන කෝණ දක්වමින් ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයේ හැඩය දළ සටහන් කරන්න.




හෝ




ව්‍යුහය (03)

කෝණ $(01) \times 2 =$ ලකුණු 05

ලකුණු වෙන වෙන ම ප්‍රදානය කරන්න.

(vi) ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයෙහි පහත දක්වා ඇති බන්ධන සෑදීම සඳහා සහභාගී වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනාගන්න. පහත දක්වෙන පරිදි ඔක්සිජන් පරමාණු 1, 2 සහ 3 ලෙස නම් කර ඇත:

$\overset{1}{O}-\overset{2}{O}-N-\overset{3}{O}$

I. $\overset{1}{O}$ සහ $\overset{2}{O}$ (මුහුම් කාක්ෂික) හෝ 2p (පරමාණුක කාක්ෂික) සහ $sp^3$ (මුහුම් කාක්ෂික) $(02 + 02 =$ ලකුණු 04)

II. $\overset{2}{O}$ සහ N $sp^3$ (මුහුම් කාක්ෂික) සහ $sp^2$ (මුහුම් කාක්ෂික) $(02 + 02 =$ ලකුණු 04)

(vii) පෙරොක්සිනයිට්‍රස් අම්ලයෙහි සමාවයවිකයක් දෙන්න.

$HNO_3$ (නයිට්‍රික් අම්ලය) [nitric(v) acid පිළිගත හැකිය] (ලකුණු 03)

(c) (i) පහත දී ඇති ලැයිස්තුවෙන් ධ්‍රැවීය විශේෂ දෙකක් තෝරන්න.

$H_2CO$ (ෆෝමැල්ඩිහයිඩ්), $SF_6$, COS, $ICl_4^-$, $SiCl_4$ $H_2CO$ සහ COS

$(05 \times 02 =$ ලකුණු 10)

(ii) පහත දක්වෙන එක් එක් යුගලයේ අණු අතර පවතින අන්තර්අණුක බල වර්ගය/වර්ග සඳහන් කරන්න.

I. HBr(g) සහ $H_2S$(g) ද්වි − ධ්‍රැව − ද්විධ්‍රැව + ලන්ඩන් බල *

II. $Cl_2$(g) සහ $CCl_4$(g) ලන්ඩන් බල *

III. $CH_3OH$(l) සහ $H_2O$(l) හයිඩ්‍රජන් බන්ධන + ලන්ඩන් බල *

$(02 \times 05 =$ ලකුණු 10)

* ලන්ඩන් බල / (ලන්ඩන්) අපකිරණබල /

ප්‍රේරිත ද්විධ්‍රැව - ප්‍රේරිත ද්විධ්‍රැව බල / වැන්ඩවාල්ස් බල



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

2. (*a*) (i) තුන්වන ආවර්තයේ ඇති මූලද්‍රව්‍ය මගින් සෑදෙන ඉහළම ඔක්සිකරණ අවස්ථාව සහිත ඔක්සයිඩවල සූත්‍ර දෙන්න.
පහත ලැයිස්තුව භාවිතයෙන් ඒවායේ ආම්ලික / උභයගුණී / භාෂ්මික ස්වභාවය පිළිබඳ අදහස් දක්වන්න.

ඉතා ප්‍රබල ආම්ලික, ප්‍රබල ආම්ලික, දුබල ආම්ලික, ඉතා දුබල ආම්ලික,
දුබල භාස්මික, භාස්මික, ප්‍රබල භාස්මික, උභයගුණී, උදාසීන

$Na_2O$ - ප්‍රබල භාස්මික $P_2O_5$ හෝ $P_4O_{10}$ - දුබල ආම්ලික
$MgO$ - දුර්වල භාස්මික/භාස්මික $SO_3$ - ප්‍රබල ආම්ලික/ඉතා ප්‍රබල ආම්ලික
$Al_2O_3$ - උභයගුණී $Cl_2O_7$ - ඉතා ප්‍රබල ආම්ලික
$SiO_2$ - ඉතා දුබල ආම්ලික (01 × 7 + 01 × 7 = ලකුණු 14)

(ii) තුන්වන ආවර්තය හරහා වමේ සිට දකුණට විද්‍යුත්සෘණතාව, පරමාණුක අරය සහ පළමු අයනීකරණ ශක්තිය යන මේවා කෙසේ වෙනස්වේදැයි ප්‍රකාශ කරන්න.

විද්‍යුත්සෘණතාව $Na < Mg < Al < Si < P < S < Cl$ හෝ වැඩි වේ. (ලකුණු 03)
පරමාණුක අරය $Na > Mg > Al > Si > P > S > Cl$ හෝ අඩු වේ. (ලකුණු 03)
පළමු අයනීකරණ ශක්තිය $Na < Mg > Al < Si < P > S < Cl$ හෝ $Cl > P > S > Si > Mg > Al > Na$ (ලකුණු 03)

නිවැරදි ව ලකුණු කරන ලද මූල ද්‍රව්‍ය සහිත ව අක්ෂක් විචලනය නිරූපණය (ලකුණු 03)
අක්ෂක් විචලනය පමණක් (01)

(iii) ලෝහය ලෙස M භාවිත කරමින් II කාණ්ඩයේ නයිට්රේටවල තාප වියෝජනය සඳහා පොදු ප්‍රතික්‍රියාවක් දෙන්න. $2M(NO_3)_2 \longrightarrow 2MO + 4NO_2 + O_2$ (ලකුණු 03)
ඵල නිවැරදි නමුත් ප්‍රතික්‍රියාව තුලිත නැති නම් (02)

(iv) II කාණ්ඩයේ නයිට්රේට තාප ස්ථායිතාව වැඩිවන අනුපිළිවෙළට (< සංකේතය භාවිත කරමින්) සකස් කරන්න. අයනවල ධ්‍රැවීයකරණය අනුසාරයෙන් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.
ස්ථායීතාව වැඩි වන අනුපිළිවෙළ : $Be(NO_3)_2 < Mg(NO_3)_2 < Ca(NO_3)_2 < Sr(NO_3)_2 < Ba(NO_3)_2$
එකම ඇනායනය (01) එක ම කැටායන ආරෝපණය (01) නමුත් කාණ්ඩයේ
පහළට විශාලත්වය වැඩි වේ. (01)
∴ ධ්‍රැවීකරණ බලය $Be^{2+} > Mg^{2+} > Ca^{2+} > Sr^{2+} > Ba^{2+}$ (01)
කාණ්ඩයේ පහළට කැටායනය මගින් වන නයිට්රේට් අයනයේ ධ්‍රැවීකරණය අපහසු ය. (01)
එබැවින් කාණ්ඩයේ පහළට තාපස්ථායීතාවය වැඩි වේ.
(ලකුණු 05)

(*b*) පහත දක්වෙන ප්‍රශ්න Mn යන ආන්තරික මූලද්‍රව්‍ය සහ එහි සංයෝග මත පදනම් වී ඇත.

(i) Mn වල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය දෙන්න.
$1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^5\ 4s^2$ හෝ ......... $4s^2\ 3d^5$ (ලකුණු 05)

(ii) Mn වල සුලබ ඔක්සිකරණ අවස්ථා දක්වන්න.
+2, +4, +7 (+6) (ඕනෑ ම තුනක්) හෝ +II, +IV, +VII, (+VI) (ඕනෑ ම තුනක්)
(02 × 3 = ලකුණු 06)

(iii) මෙම සුලබ ඔක්සිකරණ තත්ත්වවලදී Mn සාදන ඔක්සයිඩවල රසායනික සූත්‍ර දෙන්න. මෙම එක් එක් ඔක්සයිඩය ආම්ලික ද උභයගුණී ද භාස්මික ද යන වග දක්වන්න.

$MnO$ - භාස්මික (02 + 01 = ලකුණු 03)
$MnO_2$ - උභයගුණී (02 + 01 = ලකුණු 03)
$Mn_2O_7$ - ආම්ලික $MnO_3$ - ආම්ලික (ඕනෑ ම තුනක්) (02 + 01 = ලකුණු 03)



Visit EDUHUB සියලු ම විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iv) $KMnO_4$ සඳහා IUPAC නාමය දෙන්න.

potassium manganate(VII) (ලකුණු 06)

(v) 3*d* ආන්තරික මූලද්‍රව්‍ය අතුරෙන් Mn වලට අඩුම ද්‍රවාංකය හා අඩුම තාපාංකය ඇත. ඒ ඇයිදැයි විස්තර කරන්න.

3d සහ 4s ඉලෙක්ට්‍රෝන වර්ග දෙක ම ලෝහක බන්ධන සෑදීම සඳහා විස්ථානගත වී ඇත. (02)

Mnවල අර්ධව පිරුණු උපශක්ති මට්ටම සහ සම්පූර්ණයෙන් ම පිරුණු 4s උපශක්ති මට්ටම්වල වූ ඉලෙක්ට්‍රෝන නිසා (02) ඒවාට විස්ථානගත වීමේ හැකියාව අඩු වී ඇත. (02) (ලකුණු 06)

(vi) ජලීය $Mn^{2+}$ ද්‍රාවණයකට තනුක ඇමෝනියා ද්‍රාවණයක් එක්කර ඉන්පසු වාතයට නිරාවරණය කිරීමේදී ඔබ නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තුවන්නේ මොනවා ද?

beige / ලා රෝස / (සුදු) අවක්ෂේපය (03)

වාතයට නිරාවරණය කළ විට අවක්ෂේපය දුඹුරු / කළු - දුඹුරු බවට පත්වේ. (03) (ලකුණු 06)

* කළු අවක්ෂේපය - ලකුණු නැත

(vii) ජලීය $KMnO_4$ ද්‍රාවණයකට සාන්ද්‍ර KOH එක්කිරීමේදී කොළපාට විය. එම කොළපාට ද්‍රාවණය ජලය හෝ අම්ල භාවිතකර තනුක කිරීමේදී දම් පැහැති ද්‍රාවණයක් සහ කළු පැහැති දුඹුරු අවක්ෂේපයක් ලැබෙයි. ඔබගේ නිරීක්ෂණ පැහැදිලි කිරීම සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

$4MnO_4^- + 4OH^- \longrightarrow 4MnO_4^{2-} + 2H_2O + O_2$ (ලකුණු 04)

$3MnO_4^{2-} + 4H^+ \longrightarrow 2MnO_4^- + MnO_2 + 2H_2O$

හෝ

$3MnO_4^{2-} + 2H_2O \longrightarrow 2MnO_4^- + MnO_2 + 4OH^-$ (ලකුණු 04)

(viii) පහත එක් එක් ඒවායේ එක් වැදගත් භාවිතයක් දෙන්න.

I. $KMnO_4$ (ඔක්සිකාරකයක් ලෙස හැර)

විෂබීජනාශක ලෙස / රෝග බීජ නාශක ලෙස / විසන්ධකයක් ලෙස (deodorant) / ස්වදර්ශක ලෙස ඇනෝඩ කැතෝඩ හඳුනා ගැනීමට / $O_2$ පිළියෙල කිරීම සඳහා (ලකුණු 03)

II. Mn ලෝහය

වානේ හෝ මිශ්‍ර ලෝහ සෑදීමට (ලකුණු 03)

(ix) ආම්ලික හා භාෂ්මික මාධ්‍යවලදී $KMnO_4$ ඔක්සිකාරකයක් ලෙස හැසිරෙන්නේ කෙසේදැයි පෙන්වීමට අර්ධ ප්‍රතික්‍රියා දෙන්න.

ආම්ලික මාධ්‍යය : $MnO_4^- + 8H^+ + 5e \longrightarrow Mn^{2+} + 4H_2O$ (ලකුණු 03)

භාෂ්මික මාධ්‍යය : $MnO_4^- + 2H_2O + 3e \longrightarrow MnO_2 + 4OH^-$ or $MnO_4^- + e \longrightarrow MnO_4^{2-}$ (ලකුණු 03)

(x) ඔක්සිකාරකයක් ලෙස $KMnO_4$ භාවිතයේදී ඔබ බලාපොරොත්තුවන ගැටලු දෙකක් දක්වන්න.

- $Cl^-$ හා $Br^-$ ඇති විටක දී භාවිත කළ නොහැකිය.
- ජලීය ද්‍රාවණය ස්ථායී නොවන නිසා ප්‍රාථමික සම්මතකාරකයක් ලෙස භාවිතා කළ නොහැකිය.
- තද වර්ණයක් නිසා සමහර අවස්ථාවල දී ස්ථිතිකවල දිය වීම වැනි නිරීක්ෂණ ලබාගත නොහැකි වීම.
- ද්‍රාවණය තුළ $MnO_2$ දුඹුරු පාට අවක්ෂේපයක් සෑදිය හැකි ය.

(ඕනෑ ම 02ක්) (03 × 2 = ලකුණු 06)

(වෙනත් පිළිතුරකට ලකුණු ප්‍රදානය කිරීම සඳහා පාලක පරීක්ෂකවරයාගේ අනුමැතිය ලැබිය යුතුය.)



Visit EDUHUB ... කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



3. (a) $P$ පීඩනයෙහිදී සහ $T$ උෂ්ණත්වයෙහිදී $O_2(g)$ සහ $O_3(g)$ මිශ්‍රණයක්, පරිමාව $V$ වන දෘඪ සංවෘත භාජනයක් තුළ සමතුලිතතාවේ පවතියි.

(i) $n_1, n_2, M_1, M_2$ හා $V$ ඇසුරෙන්, වායු මිශ්‍රණයෙහි ඝනත්වය ($d$) ප්‍රකාශ කරන්න.

මෙහි, $n_1$ = $O_2$ මවුල සංඛ්‍යාව　　$n_2$ = $O_3$ මවුල සංඛ්‍යාව

$M_1$ = $O_2$ හි මවුලික ස්කන්ධය　　$M_2$ = $O_3$ හි මවුලික ස්කන්ධය

ඝනත්වය ($d$) = ස්කන්ධය / පරිමාව (ලකුණු 03)

$$= \frac{m_{O_2} + m_{O_3}}{V}$$ (ලකුණු 03)

$$= \frac{n_1 M_1 + n_2 M_2}{V}$$ (ලකුණු 04)

සටහන : අවසාන පියවර නිවැරදි නම් මුළු ලකුණු ප්‍රමාණය (10) ප්‍රදානය කරන්න.

(මුළු ලකුණු 10)

(ii) ඉහත සම්බන්ධතාව $X_1, X_2, M_1, M_2, V$ සහ $n$ ඇසුරෙන් ප්‍රකාශ කරන්න.

මෙහි, $X_1$ = $O_2$ හි මවුල භාගය　　$X_2$ = $O_3$ හි මවුල භාගය

$n$ = වායු දෙකෙහිම මුළු මවුල සංඛ්‍යාව

$$n = n_1 + n_2$$ (ලකුණු 03)

$$d = \frac{\left[\frac{n_1}{n_1 + n_2}\right] M_1 + \left[\frac{n_2}{n_1 + n_2}\right] M_2}{V} (n_1 + n_2)$$ (ලකුණු 03)

$$= \frac{X_1 M_1 + X_2 M_2}{V} \times n$$ (ලකුණු 04)

සටහන : අවසාන පියවර නිවැරදි නම් මුළු ලකුණු ප්‍රමාණය (10) ප්‍රදානය කරන්න.

(මුළු ලකුණු 10)

(iii) එනයින්, $X_1 = \left(3 - \frac{dRT}{16P}\right)$ බව පෙන්වන්න.

මෙහි $R$ යනු සාර්වත්‍ර වායු නියතය වේ. (O හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය = 16)

$X_2 = 1 - X_1$ හෝ $X_1 + X_2 = 1$ (ලකුණු 04)

$$d = \frac{X_1 M_1 + (1 - X_1) M_2}{V} n$$ (ලකුණු 04)

මිශ්‍රණය සඳහා $pV = nRT$ හෝ $\frac{n}{V} = \frac{p}{RT}$ (ලකුණු 04)

$$d = [X_1 M_1 + (1 - X_1) M_2] \frac{p}{RT}$$ (ලකුණු 04)

$$X_1 M_1 + (1 - X_1) M_2 = \frac{dRT}{p}$$

මවුලික ස්කන්ධ සඳහා ආදේශ කිරීමෙන්, $32 X_1 + 48(1 - X_1) = \frac{dRT}{p}$ (ලකුණු 04)

$$16 X_1 = 48 - \frac{dRT}{p}$$

$$X_1 = 3 - \frac{dRT}{16p}$$

(ලකුණු 03 + 01)

(මුළු ලකුණු 24)

(iv) ඉහත පියවරවලදී ඔබ භාවිත කළ උපකල්පනය/උපකල්පන සඳහන් කරන්න.

උපකල්පන : $O_2(g)$ සහ $O_3(g)$ එකිනෙක ප්‍රතික්‍රියා නොකරයි. හෝ

$O_2(g)$ සහ $O_3(g)$ මිශ්‍රණය පරිපූර්ණ ව හැසිරේ. (ලකුණු 06)

(මුළු ලකුණු 50)



Visit EDUHUB කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(*b*) (i) පහත දක්වෙන සම්මත ඔක්සිහරණ විභව සලකන්න.

$$E^{\ominus}\ [Br_2(l)/Br^-(aq)] = 1.07\ V$$

$$E^{\ominus}\ [I_2(s)/I^-(aq)] = 0.54\ V$$

I. 1.0 mol $dm^{-3}$ ජලීය KI ද්‍රාවණයකට ද්‍රව බ්‍රෝමීන් එක් කළ විට සිදුවෙතැයි ඔබ අපේක්ෂා කරන ප්‍රතික්‍රියාව කුමක් ද?

$Br_2(l) + 3I^-(aq) \longrightarrow 2Br^-(aq) + I_3^-(aq)$ හෝ $Br_2(l) + 2I^-(aq) \longrightarrow 2Br^-(aq) + I_2(s)$

(ලකුණු 10)

$K^+$ යොදන ලද තුලිත සමීකරණයකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.
සටහන : භෞතික අවස්ථා හෝ තුලිත රසායනික සමීකරණය දී නැත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න.

II. ඉහත පරීක්ෂණයේදී ඔබ අපේක්ෂා කරන වර්ණ විපර්යාස ලියා දක්වන්න.

අවර්ණ / ලා කහ පැහැති ද්‍රාවණය දුඹුරු පැහැයට හැරේ. (ලකුණු 05)

(ii) පහත සඳහන් විද්‍යුත් රසායනික සමීකරණය සලකන්න.

$$Mg(s)\ +\ 2H^+(aq)\ \longrightarrow\ Mg^{2+}(aq)\ +\ H_2(g)$$

I. ඉහත ප්‍රතික්‍රියාවට අනුකූල වන ගැල්වානීය කෝෂයෙහි කැතෝඩීය ප්‍රතික්‍රියාව ලියන්න.

$2H^+(aq) + 2e \longrightarrow H_2(g)$ හෝ $2H_3O^+(aq) + 2e \longrightarrow H_2(g) + 2H_2O(l)$ (ලකුණු 05)

සටහන : භෞතික අවස්ථා හෝ තුලිත රසායනික සමීකරණය දී නැත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න.

II. ඉහත කෝෂය නිරූපණය කිරීම සඳහා සම්මුතික අංකනය (conventional notation), ද්‍රව්‍ය අවස්ථාවක් අඩංගු කරමින් ලියා දක්වන්න.

$Mg(s) / Mg^{2+}(aq) // H^+(aq) / H_2(g), Pt(s)$ (ලකුණු 10)

[$Mg(s) / Mg^{2+}(aq) // H^+(aq) / H_2(g) / Pt(s)$ ආකාරය ද පිළිගත හැකි ය.]

සටහන : භෞතික අවස්ථා දී නැත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න.
$H^+$ වෙනුවට $H_3O^+$ පිළිගත හැකි ය.

III. ඉහත කෝෂ ප්‍රතික්‍රියාව ඉදිරියට යන විට එන්ට්‍රොපිය වැඩිවේ ද, අඩුවේ ද, නැතහොත් නියතව පවතී ද?

එන්ට්‍රොපිය වැඩි වේ. (ලකුණු 05)

ඔබේ පිළිතුර **සැකෙවින්** පැහැදිලි කරන්න.

ඝන සහ ද්‍රව ප්‍රතික්‍රියක වායුමය ඵලයක් [හෝ $H_2(g)$] දෙයි. (ලකුණු 05)

IV. *T* උෂ්ණත්වයේදී ඉහත ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධව සිදුවීම සඳහා එන්තැල්පි වෙනස (ΔH) සහ එන්ට්‍රොපි වෙනස (ΔS) අතර තිබිය යුතු සම්බන්ධතාව කුමක් ද?

$\Delta H - T\Delta S < 0$ හෝ $\Delta H < T\Delta S$ හෝ $\Delta H / T < \Delta S$ (ලකුණු 10)

හෝ වෙනත් පිළිගත හැකි ආකාරයක් (මුළු ලකුණු 50)



Visit EDUHUB ... කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. (*a*) A, B සහ C යනු අණුක සූත්‍රය $C_7H_{14}$ වන සමාවයවික හයිඩ්‍රොකාබන තුනකි. A සංයෝගය ජ්‍යාමිතික සමාවයවිකතාව පෙන්වන අතර, B සහ C සංයෝග එය නොපෙන්වයි. සංයෝග තුනම ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි. උත්ප්‍රේරිත හයිඩ්‍රජනීකරණයේදී සංයෝග තුනම, D ($C_7H_{16}$) සංයෝගය ලබාදෙයි. D සංයෝගය ද ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි. A, B, C සහ D හි ව්‍යුහ දක්වන්න. (ත්‍රිමාන සමාවයවික ආකාර ඇඳීම අවශ්‍ය **නොවේ.**)


A


B


C


D

බ්‍රෝමීන් සමඟ පිරියම් කර, ඉන්පසු මද්‍යසාරීය KOH සමඟ හයිඩ්‍රොබ්‍රෝමීන්හරණය කළ විට, A සංයෝගය E සහ F සංයෝග දෙක සාදන අතර, B සංයෝගය G ද, C සංයෝගය H ද සාදයි. E, F, G සහ H යන සංයෝග සතරටම $C_7H_{12}$ යන එකම අණුක සූත්‍රය ඇත. E සංයෝගය ජ්‍යාමිතික සමාවයවිකතාව පෙන්වන අතර, F, G සහ H සංයෝග එය නොපෙන්වයි. E, F, G සහ H හි ව්‍යුහ දක්වන්න.


E


F


G


H

(ලකුණු 08 × 8)

- A වැරදි නම් E සහ F ට ලකුණු නැත; B වැරදි නම් G ට ලකුණු නැත; C වැරදි නම් H ට ලකුණු නැත.
- A සහ E සඳහා ජ්‍යාමිතික සමාවයවික නොසලකන්න.
- B හා C කොටුවල සංයෝග මාරු විය හැකි ය. එවිට එයට අනුරූප ව G හා H ද මාරු විය යුතු ය.

**F සහ G එකිනෙකින් වෙන්කර හඳුනාගැනීම සඳහා එක් රසායනික පරීක්ෂාවක් දෙන්න.**

ඇමෝනීය $AgNO_3$ හෝ ඇමෝනීය CuCl එකතු කළ විට (ලකුණු 02)

F - අවක්ෂේපයක් නැත (ලකුණු 02)

G - $AgNO_3$ සමග (සුදු) අවක්ෂේපයක් හෝ CuCl සමග (චොකලට් දුඹුරු) අවක්ෂේපයක් (ලකුණු 02)

(අවක්ෂේපයේ වර්ණය අවශ්‍ය නැත) ($08 \times 8 + 02 \times 3 =$ ලකුණු 70)

(*b*) අංක 1 සිට 5 තෙක් ඇති එක් එක් ප්‍රතික්‍රියාවෙහි ප්‍රතික්‍රියකය සහ ප්‍රතිකාරකය පහත වගුවෙහි දී ඇත.

එම එක් එක් ප්‍රතික්‍රියාව සඳහා ප්‍රතික්‍රියා වර්ගය [න්‍යුක්ලියෝෆිලික ආකලනය ($A_N$), ඉලෙක්ට්‍රොෆිලික ආකලනය ($A_E$), න්‍යුක්ලියෝෆිලික ආදේශය ($S_N$), ඉලෙක්ට්‍රොෆිලික ආදේශය ($S_E$), ඉවත්කිරීම (E)] සහ ප්‍රධාන ඵලය අදාළ කොටු තුළ ලියන්න.

| | ප්‍රතික්‍රියකය | ප්‍රතිකාරකය | ප්‍රතික්‍රියා වර්ගය | ප්‍රධාන ඵලය |
|---|---|---|---|---|
| 1 |  | සාන්ද්‍ර $HNO_3$ / සාන්ද්‍ර $H_2SO_4$ | $S_E$ |  |
| 2 | $CH_3CH{=}CH_2$ | HBr | $A_E$ |  |
| 3 | $CH_3CHO$ | $H^+$ / KCN | $A_N$ |  |
| 4 | $CH_3CH_2CHBrCH_3$ | මද්‍යසාරීය KOH | E | $CH_3-CH=CH-CH_3$ |
| 5 | $CH_3CH_2I$ | ජලීය KCN | $S_N$ | $CH_3CH_2CN$ |

(ලකුණු $03 \times 10 =$ ලකුණු 30)

- ප්‍රතික්‍රියා වර්ගය වචනයෙන් ද ලිවිය හැකිය.
- ප්‍රතික්‍රියා වර්ගයට හා ප්‍රධාන ඵලයට ස්වාධීන ව ලකුණු ප්‍රදානය කරන්න.



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

5. (*a*) (i) $2A(g) \rightleftharpoons B(g)$

| | $2A(g)$ | $B(g)$ | |
|---|---|---|---|
| ආරම්භයේ දී, | a | -- | mol |
| සමතුලිතතාවේ දී, | $a - \frac{40}{100}a$ | $\frac{20}{100}a$ | mol |
| | $= 0.6\ a$ | $= 0.2\ a$ | mol |

2 × (02 + 01)

මවුල භාගය $\frac{0.6\ a}{0.8\ a} = 3/4$ $\frac{0.2\ a}{0.8\ a} = 1/4$ (03)

$$K_p = \frac{p_B}{p_A^2}$$ (03)

$$K_p = \frac{\frac{1}{4} \times (4 \times 10^5\,N\,m^{-2})}{\left[\frac{3}{4} \times (4 \times 10^5\,N\,m^{-2})\right]^2}$$ 2 × (02 + 01)

$$= \frac{1}{9} \times 10^{-5}\,N^{-1}\,m^2 \text{ හෝ } 1.1 \times 10^{-5}\,N^{-1}\,m^2$$ (02 + 01)

5(*a*)(i) සඳහා මුළු ලකුණු **21**

(ii) I. $2A(g) \rightleftharpoons B(g)$ (1)

$2A(g) \rightleftharpoons C(g) + D(g)$ (2)

A(g)හි ආරම්භක ප්‍රමාණය = a

සමතුලිතතාවේ දී, C(g) හි ප්‍රමාණය = $\frac{1}{10}$ a (03)

D(g) හි ප්‍රමාණය = $\frac{1}{10}$ a (03)

A(g) හි ප්‍රමාණය = $\frac{2}{10}$ a (03)

(1) සමතුලිතතාවට සහභාගී වූ A(g) හි ප්‍රමාණය = $\frac{6}{10}$ a (03)

B(g) හි ප්‍රමාණය = $\frac{3}{10}$ a (03)

ඉහත ගණනය කිරීම් තර්කානුකූල ව කිරීම සඳහා (03)

**'a' හැර වෙන සංකේතයක් යොදා ඇති නම් C,D සහ Aහි ප්‍රමාණයන් ගණනයට එක් එක් පියවරකට ලකුණු 02ක් පමණක් ප්‍රදානය කරන්න.**

5(*a*)(ii)I සඳහා මුළු ලකුණු **15**

II. A(g), B(g), C(g) හා D(g) හි මුළු මවුල සංඛ්‍යාව = $\frac{2}{10}a + \frac{3}{10}a + \frac{1}{10}a + \frac{1}{10}a$

$= \frac{7}{10}a$ (03)

A හි මවුල භාගය = $\frac{2a/10}{7a/10} = \frac{2}{7}$ (03)

B හි මවුල භාගය = $\frac{3a/10}{7a/10} = \frac{3}{7}$ (03)

C හි මවුල භාගය = $\frac{a/10}{7a/10} = \frac{1}{7}$ (03)

D හි මවුල භාගය = $\frac{a/10}{7a/10} = \frac{1}{7}$ (03)



Visit EDUHUB කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

$$K_p = \frac{p_C\, p_D}{p_A^2}$$ **(03)**

$$K_p = \frac{\frac{1}{7}P \times \frac{1}{7}P}{\left[\frac{2}{7}P\right]^2}$$ **(03)**

$= 1/4$ හෝ $0.25$ **(02 + 01)**

**5($a$)(ii)II සඳහා මුළු ලකුණු 24**

III. $T$ හි දී මුළු මවුල සංඛ්‍යාව $= 0.6a + 0.2a = 0.8a$

$pV = nRT$ හෝ නියත $V$ හි දී $\frac{p}{T} \propto n$ **(03)**

$T$ හි දී, $\frac{4 \times 10^5\,\mathrm{N\,m^{-2}}}{T} \propto 0.8a$ (1)

$2T$ හි දී, $\frac{p}{2T} \propto 0.7a$ (2) (1) සහ (2) යන දෙක ම සඳහා **(02+01)**

$\frac{(1)}{(2)}$ $\frac{4 \times 10^5\,\mathrm{N\,m^{-2}}}{P/2} = \frac{0.8a}{0.7a}$ **(03)**

$P = 7 \times 10^5\,\mathrm{N\,m^{-2}}$ **(02 + 01)**

සටහන : $pV = nRT$ යොදා පීඩනය ගණනය කිරීම සඳහා මුළු ලකුණු ප්‍රමාණය (12) ප්‍රදානය කරන්න.

A හි ආංශික පීඩනය $= \frac{2}{7} \times (7 \times 10^5\,\mathrm{N\,m^{-2}}) = 2 \times 10^5\,\mathrm{N\,m^{-2}}$ **(02+01)**

B හි ආංශික පීඩනය $= \frac{3}{7} \times (7 \times 10^5\,\mathrm{N\,m^{-2}}) = 3 \times 10^5\,\mathrm{N\,m^{-2}}$ **(02+01)**

$$K_p = \frac{(3 \times 10^5\,\mathrm{N\,m^{-2}})}{(2 \times 10^5\,\mathrm{N\,m^{-2}})^2}$$ **02+01**

$= 7.5 \times 10^{-6}\,\mathrm{N^{-1}\,m^2}$ **(03 + 01)**

**5($a$)(ii)III සඳහා මුළු ලකුණු 24**

| **5($a$) සඳහා මුළු ලකුණු** | **85** |
|---|---|

($b$) (i) $CH_3COOH$ ආරම්භක ප්‍රමාණය $= 1.0\ \mathrm{mol\ dm^{-3}} \times \frac{40.00}{1000}\ \mathrm{dm^3}$

$= 0.040$ mol **(02 + 01)**

$CH_3COOH + NaOH \longrightarrow CH_3COONa + H_2O$

ස්තර වෙන් වූ පසු,

ජලීය ස්තරයේ $10.00\ \mathrm{cm^3}$ක තිබෙන $CH_3COOH$ ප්‍රමාණය

$= 0.5\ \mathrm{mol\ dm^{-3}} \times \frac{16.00}{1000}\ \mathrm{dm^3}$

$= 0.008$ mol **(02 + 01)**

ජලීය ස්තරයේ තිබෙන $CH_3COOH$ ප්‍රමාණය

$= 0.008\ \mathrm{mol} \times \frac{40.00\ \mathrm{cm^3}}{10.00\ \mathrm{cm^3}}$

$= 0.032$ mol **(02 + 01)**



Visit EDUHUB ... කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

බියුටනෝල් ස්තරයේ තිබෙන $CH_3COOH$ ප්‍රමාණය = 0.040 mol − 0.032 mol
= 0.008 mol (02 + 01)

බියුටනෝල් ස්තරයේ 10.00 $cm^3$ක තිබෙන $CH_3COOH$ ප්‍රමාණය

$$= 0.008\ \text{mol} \times \frac{10.00\ \text{cm}^3}{20.00\ \text{cm}^3}$$

= 0.004 mol (02 + 01)

බලාපොරොත්තු වූ අන්ත ලක්‍ෂ්‍යය ($x$) $= \dfrac{0.004\ \text{mol}}{0.50\ \text{mol dm}^{-3}}$

$= 0.008\ \text{dm}^3$ හෝ $8.0\ \text{cm}^3$ (02 + 01)

5(*b*)(i) සඳහා මුළු ලකුණු **18**

(ii) ජලීය ස්තරයේ 10.00 $cm^3$ක තිබෙන $CH_3COOH$ ප්‍රමාණය = 0.008 mol
බියුටනෝල් ස්තරයේ 10.00 $cm^3$ක තිබෙන $CH_3COOH$ ප්‍රමාණය = 0.004 mol

විභාග සංගුණකය $= \dfrac{[CH_3COOH]_{but}}{[CH_3COOH]_{H_2O}}$ (03)

$$= \frac{0.004\ \text{mol}/(10.00/1000\ \text{cm}^3)}{0.008\ \text{mol}/(10.00/1000\ \text{cm}^3)} = 0.5$$ (02 + 01)

---

**5(*b*)(ii) සඳහා විකල්ප පිළිතුර**

බියුටනෝල් ස්තරය සඳහා අවශ්‍ය වූ NaOH පරිමාව ජලීය ස්තරය සඳහා අවශ්‍ය වූ පරිමාවෙන් අඩකි. (03)

එම නිසා, විභාග සංගුණකය $= \dfrac{[CH_3COOH]_{but}}{[CH_3COOH]_{H_2O}} = 0.5$ (02 + 01)

---

සටහන : 1. විභාග සංගුණකය $= \dfrac{[CH_3COOH]_{H_2O}}{[CH_3COOH]_{but}} = 2$ සඳහා ද මුළු ලකුණු දිය යුතු ය.

2. එක් එක් ස්තරයේ 10.00 $cm^3$ක තිබෙන $CH_3COOH$ මවුල ප්‍රමාණය ද විභාග සංගුණකය ගණනය කිරීම සඳහා යොදා ගත හැකි ය.

5(*b*)(ii) සඳහා මුළු ලකුණු **06**

(iii) $CH_3COOH$ ප්‍රමාණය $= 1.0\ \text{mol dm}^{-3} \times \dfrac{30.00}{1000}\ \text{dm}^3$
= 0.030 mol (03)

කලාප දෙකේ ම මුළු පරිමා සඳහා අවශ්‍ය වූ NaOH පරිමාව

$$= \frac{0.030\ \text{mol}}{0.50\ \text{mol dm}^{-3}}$$

$= 60.0\ \text{cm}^3$ (02 + 01)

$4y + 2z = 60.0$ (1) (03)

$\dfrac{z}{y} = \dfrac{1}{2}$ (2) (03)

(1) සහ (2) න්,

$y = 12.00\ \text{cm}^3$ (02 + 01)

$z = 6.00\ \text{cm}^3$ (02 + 01)

---



Visit EDUHUB ... කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

5($b$)(iii) සඳහා විකල්ප පිළිතුර

1. බෝතලයේ $CH_3COOH$ ආරම්භක සාන්ද්‍රණය = $1.0\ mol\ dm^{-3}$
2. බෝතලයේ $CH_3COOH$ ආරම්භක සාන්ද්‍රණය = $\frac{3}{4} \times 1.0\ mol\ dm^{-3}$ **(05 + 01)**

එම නිසා, $y = \frac{3}{4} \times 16.00\ cm^3$ **(03)**

$= 12.00\ cm^3$ **(02 + 01)**

$z = \frac{3}{4} \times 8.00\ cm^3$ **(03)**

$= 6.00\ cm^3$ **(02 + 01)**

---

5($b$)(iii) සඳහා මුළු ලකුණු **18**

(iv) 1. බියුටනෝල් සහ ජලීය ස්තර එකිනෙක මිශ්‍ර නො වේ.

2. බියුටනෝල් වාෂ්ප නොවේ හෝ බියුටනෝල් ස්තරයේ පරිමාව වෙනස් නො වේ.

3. $CH_3COOH$ හි අයනීකරණ ප්‍රමාණය නොගිනිය හැකි ය.

4. බියුටනෝල් ස්තරයේ දී ඇසිටික් අම්ලය ද්විඅවයවීකරණය නො වේ හෝ එක ම අණුක ව්‍යුහයෙන් පවතී.

ඕනෑ ම නිවැරදි උපකල්පන දෙකක් සඳහා **(03 × 2 = 06)**

(v) ෆිනෝල්ප්තැලීන් හෝ බ්‍රෝමොතයිමෝල් බ්ලූ **(03)**

(vi) ඔව් **(02)**

බෝතල් සොලවමින් තිබූ කාලය තුළ දී, $CH_3COOH$ අණු බියුටනෝල් ස්තරයට ගමන් කරයි. **(03)**

$[CH_3COOH]_{aq}$ අඩු වේ. **(03)**

$[H_3O^+]_{aq}$ අඩු වී pH වැඩි වේ. **(03)**

5($b$)(iv) සඳහා මුළු ලකුණු **14**

| 5($b$) සඳහා මුළු ලකුණු | 65 |
|---|---|



Visit EDUHUB කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

6. (*a*) (i) සාන්ද්‍රණය $c$ mol dm$^{-3}$ වන ජලීය $CH_3COOH$ ද්‍රාවණයක pH සඳහා ප්‍රකාශනයක්, අම්ල විඝටන නියතය $K_a$ සහ $c$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(ii) ඉහත ව්‍යුත්පන්න කිරීමේදී ඔබ කරන ලද උපකල්පන ලියන්න.

(iii) ඉහත අම්ල ද්‍රාවණයෙහි 100.0 cm$^3$ ක නියැදියක්, ආශ්‍රත ජලය එකතුකිරීමෙන් 1.00 dm$^3$ තෙක් තනුක කරන ලදී. ඉහත (i) කොටසෙහි ලබාගත් ප්‍රකාශනය ආධාරයෙන්, මෙම අම්ල ද්‍රාවණයෙහි pH සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(iv) ඉහත (i) සහ (iii) කොටස්වල ලබාගත් පිළිතුරු භාවිත කර, අම්ල ද්‍රාවණ දෙකෙහි pH අගයවල වෙනස pH ඒකක 0.5 ක් බව පෙන්වන්න.

(v) ඉහත (i) කොටසෙහි අම්ල ද්‍රාවණයෙන් 220.0 cm$^3$ ක් සහ සාන්ද්‍රණය $c$ mol dm$^{-3}$ වන NaOH ද්‍රාවණයකින් 20.0 cm$^3$ ක් මිශ්‍ර කර සාද ගන්නා ද්‍රාවණයේ pH ගණනය කරන්න.

*(ලකුණු 7.5 යි.)*

(*b*) (i) 25 °C දී, $BaSO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.0 \times 10^{-10}$ mol$^2$ dm$^{-6}$ වේ. මෙම උෂ්ණත්වයේදී ජලීය සංතෘප්ත $BaSO_4$ ද්‍රාවණයක $Ba^{2+}$ සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) 25 °C දී, ඉහත (i) කොටසෙහි ද්‍රාවණයේ $Ba^{2+}$ සාන්ද්‍රණය හරි අඩක් බවට පත්කිරීම සඳහා එහි 1.0 dm$^3$ කට එක් කළ යුතු සංශුද්ධ ඝන $Na_2SO_4$ ස්කන්ධය ගණනය කරන්න. (O = 16, Na = 23, S = 32)
මෙම ගණනය කිරීමේදී ඔබ විසින් කරන ලද උපකල්පන ඇතොත් ඒවා ප්‍රකාශ කරන්න.

(iii) 25 °C දී, $PbSO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.6 \times 10^{-8}$ mol$^2$ dm$^{-6}$ වේ. මෙම උෂ්ණත්වයේදී, $BaSO_4$ සහ $PbSO_4$ යන දෙකෙන්ම සංතෘප්ත වූ ජලීය ද්‍රාවණයක $Ba^{2+}$ සහ $Pb^{2+}$ සාන්ද්‍රණ වෙන් වෙන්ව ගණනය කරන්න.

*(ලකුණු 7.5 යි.)*

6. (*a*) (i)

$$CH_3COOH(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + CH_3COO^-(aq) \qquad (03)$$

| | $CH_3COOH(aq)$ | $H_3O^+(aq)$ | $CH_3COO^-(aq)$ | | |
|---|---|---|---|---|---|
| ආරම්භයේ දී, | $c$ | --- | --- | mol dm$^{-3}$ | |
| සමතුලිතතාවේ දී, | $c - x$ | $x$ | $x$ | mol dm$^{-3}$ | (02 + 01) |

$$K_a = \frac{[H_3O^+(aq)]\,[CH_3COO^-(aq)]}{[CH_3COOH(aq)]} \qquad (03)$$

$$= \frac{x^2}{c - x} \text{ mol dm}^{-3} \qquad (03)$$

සටහන : භෞතික අවස්ථා දී නැත්නම් රසායනික සමීකරණයට සහ $K_a$ ප්‍රකාශනය සඳහා ලකුණු ප්‍රදානය නොකරන්න.

$$c - x \approx c$$

$$K_a = \frac{x^2}{c} \qquad (03)$$

$$x^2 = K_a c \qquad (03)$$

$$x = [H_3O^+(aq)] = \sqrt{K_a c}$$

$$pH = -\log(\sqrt{K_a c}) \quad \text{හෝ}$$

$$pH = -\frac{1}{2}\log K_a - \frac{1}{2}\log c \qquad (03)$$

6(*a*)(i) සඳහා මුළු ලකුණු **21**

(ii) උපකල්පනය : $c$ සමග සසඳන විට $x$ නොසැලකිය හැකිය හෝ $c - x \approx c$ හෝ අයනීකරණ ප්‍රමාණය නොගිණිය හැකි ය. (03)

6(*a*)(ii) සඳහා මුළු ලකුණු **03**



Visit EDUHUB කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iii) තනුක ද්‍රාවණයේ සාන්ද්‍රණය $= c \text{ mol dm}^{-3} \times \dfrac{100 \text{ cm}^3}{1000 \text{ cm}^3}$

$= \dfrac{c}{10} \text{ mol dm}^{-3}$ (02 + 01)

$pH = -\log(\sqrt{K_a\, c/10})$ හෝ

$pH = -\frac{1}{2}\log K_a - \frac{1}{2}\log\frac{c}{10}$ (06)

**6(a)(iii) සඳහා මුළු ලකුණු 09**

(iv) තනුක ද්‍රාවණයේ pH − ආරම්භක ද්‍රාවණයේ pH

$= -\log(\sqrt{K_a\, c/10}) - [-\log(\sqrt{K_a\, c})]$ (03)

$= -\frac{1}{2}\log K_a - \frac{1}{2}\log\frac{c}{10} - \left(-\frac{1}{2}\log K_a - \frac{1}{2}\log c\right)$ (03)

$= -\frac{1}{2}\log K_a - \frac{1}{2}\log\frac{c}{10} + \frac{1}{2}\log K_a + \frac{1}{2}\log c$

$= \frac{1}{2}\log c - \frac{1}{2}\log\frac{c}{10}$ (03)

$= \frac{1}{2}\log\frac{c}{c/10}$ (03)

$= \frac{1}{2}\log 10$ (03)

$= 0.5$ (03)

**6(a)(iv) සඳහා මුළු ලකුණු 18**

(v) $CH_3COOH(aq) + NaOH(aq) \longrightarrow CH_3COONa(aq) + H_2O(l)$ (03)

ද්‍රාවණයේ මුළු පරිමාව $= 240.0 \text{ cm}^3$

සෑදුණු ලවණ සාන්ද්‍රණය $= \dfrac{20.0 \text{ cm}^3}{240.0 \text{ cm}^3} \times c \text{ mol dm}^{-3}$ (02 + 01)

ඉතිරි වූ අම්ල සාන්ද්‍රණය $= \dfrac{200.0 \text{ cm}^3}{240.0 \text{ cm}^3} \times c \text{ mol dm}^{-3}$ (02 + 01)

pH = $pK_a$ + log [ ලවණය ] / [ අම්ලය ] (06)

$$= pK_a + \log\left[\frac{\dfrac{20.0 \text{ cm}^3}{240.0 \text{ cm}^3} \times c \text{ mol dm}^{-3}}{\dfrac{200.0 \text{ cm}^3}{240.0 \text{ cm}^3} \times c \text{ mol dm}^{-3}}\right]$$ (03)

$= pK_a + \log(1/10)$ (03)

$= pK_a - 1$ (03)

**6(a)(v) සඳහා මුළු ලකුණු 24**

**6(a) සඳහා මුළු ලකුණු 75**



Visit EDUHUB කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(*b*) (i) සන්තෘප්ත $BaSO_4(s)$ ද්‍රාවණයක $Ba^{2+}$ සාන්ද්‍රණය $s$ ($mol\,dm^{-3}$) ලෙස ගනිමු.

$$BaSO_4(s) \rightleftharpoons Ba^{2+}(aq) + SO_4^{2-}(aq)$$ (03)

සමතුලිතතාවේ දී, -- $s$ $s$ (03)

$K_{sp} = [Ba^{2+}(aq)][SO_4^{2-}(aq)]$ (03)

$= s^2$

$s^2 = 1.0 \times 10^{-10}\,mol^2\,dm^{-6}$ (02 + 01)

$s = 1.0 \times 10^{-5}\,mol\,dm^{-3}$

$Ba^{2+}$ සාන්ද්‍රණය $= 1.0 \times 10^{-5}\,mol\,dm^{-3}$ (02 + 01)

සටහන : භෞතික අවස්ථා දී නැත්නම් රසායනික සමීකරණයට සහ $K_{sp}$ ප්‍රකාශනය සඳහා ලකුණු ප්‍රදානය නොකරන්න.

**6(*b*)(i) සඳහා මුළු ලකුණු** **15**

(ii) $$BaSO_4(s) \rightleftharpoons Ba^{2+}(aq) + SO_4^{2-}(aq)$$

සමතුලිතතාවේ දී, -- $5.0 \times 10^{-6}\,mol\,dm^{-3}$ $x$ (03)

මෙහි $x$ යනු අවක්ෂේපණය වන විට ද්‍රාවණයේ $SO_4^{2-}(aq)$ ($mol\,dm^{-3}$) සාන්ද්‍රණය වේ.

$K_{sp} = [Ba^{2+}(aq)][SO_4^{2-}(aq)]$ (03)

$= (5.0 \times 10^{-6}\,mol\,dm^{-3})\,x = 1.0 \times 10^{-10}\,mol^2\,dm^{-6}$ (02 + 01)

$x = 2.0 \times 10^{-5}\,mol\,dm^{-3}$ (02 + 01)

$Na_2SO_4$ වලින් ලැබෙන $SO_4^{2-}(aq)$ සාන්ද්‍රණය

$= 2.0 \times 10^{-5}\,mol\,dm^{-3} - 5.0 \times 10^{-6}\,mol\,dm^{-3}$ (03)

$= 1.5 \times 10^{-5}\,mol\,dm^{-3}$ (02 + 01)

---

**6(*b*)(ii) සඳහා විකල්ප පිළිතුර**

$$BaSO_4(s) \rightleftharpoons Ba^{2+}(aq) + SO_4^{2-}(aq)$$

සමතුලිතතාවේ දී, -- $5.0 \times 10^{-6}\,mol\,dm^{-3}$ $5.0 \times 10^{-6}\,mol\,dm^{-3} + y$ (06)

මෙහි $y$ යනු අවක්ෂේපණය වන විට $Na_2SO_4$ නිසා ලැබුණ $SO_4^{2-}(aq)$ ($mol\,dm^{-3}$) සාන්ද්‍රණය වේ.

$K_{sp} = [Ba^{2+}(aq)][SO_4^{2-}(aq)]$ (03)

